# දේශපාලන උපවාස හා සන්ධිස්ථාන

## පොට්ටු අම්මාල් 1953

1947 ඉන්දියාව දෙකඩ වී නිදහස ලබාගන්නා විට පැරැණි බ්‍රිතාන්‍ය යටත් විජිත ඉන්දියාවෙන් වැඩි කොටස ඉන්දියාවට අයත් විය. අලුතින් බිහිවූ පාකිස්තානයට ප්‍රාන්ත වශයෙන් හිමිවූයේ කුඩා ප්‍රාන්ත දෙකක් පමණකි. එනම් බටහිර පිහිටි සින්ද් ප්‍රාන්තය හා ඇෆ්ගනිස්තානයට මායිම්ව තිබෙන වයඹදිග දේශසීමා ප්‍රාන්තයයි. :හැටස්* එහෙත් විශාල ප්‍රාන්ත 2 ක් වූ බෙංගාලය හා පංජාබය දෙරට අතර සමසමව බෙදී ගියේය.
නිදහස් ඉන්දියාවේ විශාලම ප්‍රාන්තය වූයේ " මැඩ්රාස් ප්‍රසිඩන්සි" නමින් හැඳින්වුණු අග්නිදිග ප්‍රාන්තයයි. මේ ප්‍රාන්තයට බටහිර වොරිස්සා ප්‍රාන්තයේ මායිමෙන් පටන් ගෙන නැගෙනහිර



ඉන්දියාවේ බැංගලෝර් දිස්ත්‍රික්කය දක්වා විහිදී තිබුණි. එම බෙදීම අනුව එම ජනගහනයෙන් 50% ක් අයත් වූයේ වර්තමාන තමිල්නාඩුවටයි.
තෙළිඟු භාෂාව කථාකරන ආන්ද්‍රා ප්‍රදේශයේ ජනගහනය 35% ක් පමණ වූ අතර ඉතිරි 15% මලයාලම් භාෂාව කතා කරන බැන්ග්ලෝර් දිස්ත්‍රික්කවලට බෙදී ගියේය. මීට ප්‍රධාන හේතුව වූයේ දෙමළ කතා කරන පෙදෙසේ මහාරාජා පාලනයක් නොතිබූ නිසාය. තෙළිඟු භාෂාව කතා කරන ආන්ද්‍ර ජනතාවෙන් වැඩි කොටස වාසය කළේ හයිඩ්‍රාබාද් මහාරාජා (නිසාම්) ගේ පාලන ප්‍රදේශයේය. මලයාලම් භාෂාව කතා කරන ජනතාව වැඩිපුර ජීවත් වූයේ ට්‍රැවන්කෝර් හා කොචින් යන මහාරාජා පලාන ප්‍රදේශවලය.
කන්ණඩා භාෂාව කතා කරන ජනතාවගෙන් 90% ක්ම ජීවත් වූයේ මයිසූර් මහාරාජාගේ පාලන ප්‍රදේශයේය.
නිදහස ලැබුණු දා පටන් බහුතරය වූ තමිල්නා-ඩුවේ දෙමළ පාලකයන් තෙළිඟු ජනතාව වාසය කරන ප්‍රදේශවලට "කුඩම්මාගේ සැළකිලි" දක්වන බව කියමින් වෙනම ආන්ද්‍රා ප්‍රදේශයක් වෙන් කළ යුතු යැයි උද්ඝෝෂණයේ නායකයා වූයේ බ්‍රිතාන්‍ය විරෝධී නිදහස් සටනේදී "ආන්ද්‍රාවේ සිංහයා" යන විරුදාවලිය ලත් ටී. ප්‍රකාසම්ය.
කෙසේ වුවද ජාති ආගම් බේදවලින් තොර නිදහස් රාජ්‍යයක නිර්මාතෘවරයෙකු වූ අගමැති ජවහල්ලාල් නේරු කතා කරන භාෂාව පදනම් කරගෙන ප්‍රාන්ත බෙදා වෙන් කිරීම තරයේ ප්‍රතික්ෂේප කළේය. එහෙත් වෙනම ප්‍රාන්තයක් ඉල්ලීමේ සටනට නව බලවේගයක් එක් වූයේ 1953 මුල් භාගයේය. එම බලවේගය වූයේ මහත්මා ගාන්ධිතුමාගේ සමීපතමයකු වූ ජනප්‍රිය පොට්ටු ශ්‍රී අම්මාල් උද්ඝෝෂණයට එක්වීමය.

මේ අවිහිංසාවාදී නායකයා නව ආන්ද්‍රා ප්‍රදේශයක් අවශ්‍ය යැයි යන පරමාර්ථය උඩ මාරාන්තික උපවාසයක් ඇරැඹුවේය. එහෙත් අගමැති ජවහර්ලාල් නේරු තම දැඩි ප්‍රතිපත්තිය වෙනස් කිරීමට සූදානම් නොවීය. පොට්ටු ශ්‍රී අම්මාල්ගේ ගුරුදේවයන් වූ මහත්මා ගාන්ධිද බ්‍රිතාන්‍ය යටත් විජිතවාදයට විරුද්ධව උපවාස කිහිපයක් ඇරැඹීය. ඒවා මාරාන්තික උපවාස නොවේ. දින 7, 14 සහ 21 යනාදී වශයෙන් කලින් දින නියම කර උපවාසයේ යෙදුනේය. ආහාර නොගත්තද එතුමා ජලය පානය කළේය.
පොට්ටු ශ්‍රී අම්මාල්ගේ උපවාසයෙන් ඔහු කලුරිය කිරීමත් සමග තෙළිඟු කතා කරන ජනයා වෙසෙන ප්‍රදේශ පුරා මහා "ගිනි ජාලාවක් " ඇවිලෙන්නට පටන් ගත්තේය.
ජවහර්ලාල් නේරු අගමැතිතුමාගේ අධිෂ්ඨානය බිඳ වැටුණේය. එතුමා අකමැත්තෙන් ආන්ද්‍රා ප්‍රාදේශයක් පිහිටු වීමට එකඟ විය. එතැනින් ඇරැඹුණු නව ප්‍රාන්ත ක්‍රමය මහාරාජා පාලන ප්‍රදේශයෙන් ඉවත් කිරීමෙන් පසු තවත් ව්‍යාප්ත වන්නට පටන් ගත්තේය. ඒ අනුව ද්‍රවිඩ පතනයේම තමිල්නාඩු. ආණ්ද්‍රා , කේරළ හා කරණාටක යනුවෙන් ප්‍රාන්ත 4 ක් ප්‍රතිෂ්ඨාපනය විය.
තවත් විශාල ප්‍රාන්තයක් වූ බටහිර"බොම්බේ ප්‍රසිඩන්සි'' ප්‍රාන්තයද බෙදී මහාරාෂ්ට හා ගුජරාට වශයෙන් ප්‍රාන්ත 2 ක් ප්‍රතිෂ්ඨාපනය විය. ඒඑ ක් ආවර්ජනයකි.

### දෙවන ආවර්ජනය
### ශ්‍රී ලංකාව 1956

1956 ජනවාරි මාසයේදී අගමැති සර් ජෝන් කොතලාවල "සිංහල භාෂාව රටේ එකම රාජ්‍ය භාෂාව විය යුතුය" යන ප්‍රතිපත්තිය උඩ තමාට ඒ සඳහා ජනවරමක් ඉල්ලමින් පාර්ලිමේන්තුව අවුරුදු 1 1/2 කට කලින් විසුරුවා හැ රමැතිවරණයක් ප්‍රකාශයට පත් කළේය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය , සිංහල භාෂා, පෙරමුණ හා විප්ලවාදී සමසමාජ පක්ෂය යන පක්ෂ 3 එකට එක්වී එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ නායකත්වයෙන් පිහිටුවා ගත් "මහජන එක්සත් පෙරමුණ ද' සිංහල භාෂාව ලංකාවේ රාජ්‍ය භාෂාව කරන බවට ප්‍රතිඥා දෙමින් සටනට එළැඹියේය. සම සමාජ හා කොමියුනිස්ට් පක්ෂ සිංහල හා දෙමළ යන භාෂාවලට සම තැන දිය යුතුය යන ප්‍රතිපත්තිය උඩ තරඟ කළ අතර සර් ජෝන්ගේ පාලනය පැසිස්ට්වාදී යැයි කියමින් තමන් කරන නොකරන ආසනවල බණ්ඩාරනායක මහතාට සහායදීමට ඉදිරිපත් විය.

**මැතිවරණයේ ප්‍රතිඵලය ඉතිහාසයට එක්වී හමාරය. එහෙත් මැතිවරණයෙන් පසු සිදුවූයේ කුමක්ද?**
දැඩි ලිබරල්වාදියකු වූ බණ්ඩාරනායක මහතා "සිංහලය රටේ එකම රාජ්‍ය භාෂාව" බවට පත් කෙරෙන අතර දෙමළ භාෂාව පාවිච්චි කිරීමට විධිවිධාන යෙදෙන අන්දමේ පනත් කෙටුම්පතක් සකස් කළේය. මේ බව සැළවූ වහාම එතුමාට මැතිවරණයේදී ආධාර කළ දැඩි මතධාරී පිරිසක් ඊට විරුද්ධව උද්ඝෝෂණයක් ඇරැඹූහ. එම උද්ඝෝෂණයත් සමග විශ්වවිද්‍යාලයේ ආර්ථික අංශ මහාචාර්යවරයෙකු වූ ඇෆ්.ආර්. ජයසූරිය මහතා රාජ්‍ය මන්ත්‍රණ සභා ගොඩනැගිල්ලේ ශාලාවක මාරාන්තික උපවාසයක් ඇරැඹුවේය. ඔහු කියා සිටියේ පනත තනි වගන්තියකට සීමාවිය යුතු බවය. එනම් "සිංහල භාෂාව ලංකාවේ රාජ්‍ය භාෂාව වශයෙන් ප්‍රකාශයට පත් කිරීම" යන්නයි.
අවසානයේදී අගමැතිවරයා මේ ඉල්ලීම පිළිගත් බව ජයසූරිය මහතාගේ ආධාරකාර මන්ත්‍රීවරුන් පිරිසක් ඔහුට දැනුම්දුන් පසු ජයසූරිය මහතා සිය උපවාසය අත්හළේය.

අගමැතිතුමාගේ මේ තීරණය ගැන ඔහුගේ මන්ත්‍රී කණ්ඩායමේම වාමාංශික නැඹුරුවක් ඇති මන්ත්‍රීවරු බලවත් කණස්සල්ලට පත්වූහ. එක් මන්ත්‍රීවරයෙකු මෙසේ පැවසූ බව වාර්තා විය.
"දැන් අගමැතිතුමාගේ ප්‍රතිරූපය රටේ හරිම උසයි'' ඔය ජයසූරියලා" ගහන කල්" එතුමාට වදින්නේ නෑ. වැරැද්ද එතුමාගේ ශක්තිය එතුමාට නොතේරෙන එකයි''.

ඊට අවුරුදු දෙකකට පසු බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුම ඒකපාර්ශ්විකව අහෝසි කළ අවස්ථාවේද බණ්ඩාරනායක අගමැතිතුමාගේ අධිෂ්ඨාන ශක්තියේ දුර්වලතාව බොහෝ දෙනාගේ කණස්සල්ලට හේතු වූ බව අමුතුවෙන් කිව යුතු නොවේ.
එදා මෙදා තුර බොහෝ රටවල දේශපාලන ප්‍රශ්න පමණක් නොව ආර්ථික ප්‍රශ්න උඩද දේශපාලනඥයෝ සහ තවත් බොහෝ දෙනා උපවාස ඇරැඹූහ.
"දෙමළ භාෂාව විධිවිධාන පනතට" විරුද්ධව කේ.එම්.පී. රාජරත්න මහතා කළ උපවාසය මෙහිලා සිහිපත් කිරීම වටී.



ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්
ප්‍රවීණ මාධ්‍යවේදී
ඇස්.පියසේන

කෙසේ වුවද මේ ආවර්ජනයන්ගේ අරමුණ වූයේ පොට්ටු ශ්‍රී අම්මාල්ගේ උපවාසය ඉන්දියාවේ නව දේශපාලන රටාවක් බිහි කළ අන්දම පෙන්වා දෙන අතරම ජයසූරිය මහතාගේ උපාවසයෙන් දිගුකාලීනව අත්වූයේ අනිෂ්ඨ ප්‍රතිඵල ලැබීම පෙන්වා දීමටත්ය.
තුන්වන ආවර්ජනය
වැල්ලේතොට පඤ්ඤාදස්සී යන නම ලක් ලංකාවේ අස්සක් මුල්ලක් නෑර පැතිරී ගිය නමකි. එම පෙරළිකාර හිමි නම අතිශයින්ම ප්‍රසිද්ධියට පත්වූයේ රටේ මහත් ආන්දෝලනයක් ඇති කළ සතාසිවම් මිනීරුමේ සැකක-රුවකු සොයා පොලිසියට බාරදීම නිසාය. ගම් කාර්ය සභා අසුනක් සඳහා තරඟ කොට ජයගත් පළමුවන භික්ෂු නම වශයෙන්ද පඤ්ඤාදස්සී හිමි ඉතිහාසගත වීය. මේ හිමියෝද රජයේ නිලධාරීන්ට විරුද්ධව උපවාස කිහිපයක් දියත් කළහ.

පළමුවන උපවාසය කරන ලද්දේ මාතර කච්චේරියේ නිලධාරී පිරිසකට විරුද්ධවය. උපවාසයට තෝරා ගන්නා ලද්දේ එවකට කොළඹ නොරිස් පාර සහ ලෝටස් පාර මංසන්ධියේ රැකී රක්ෂා කාර්යාලය අසළ තිබූ හිස් ඉඩමේ බෝධි මූලයයි. උග්‍ර කොමියුනිස් විරෝධියකු වූ ඒ හිමියන්ගේ උපවාසය නැවැත්වීමට මාතර දිස්ත්‍රික්කයේ කිසිවෙකු ඉදිරිපත් නොවීය. අවසානයේදී ලේක්හවුස් ආයතනයේ පාර්ලිමේන්තු වාර්තාකරුවකුගේ ඉල්ලීම පිට බෙලිඅත්ත පාර්ලිමේන්තු මන්ත්‍රී ඩී.ඒ. රාජපක්ෂ මහතා එම ප්‍රශ්නවලට සාධාරණ විසඳුමක් ලබාදෙන බවට පොරොන්දු වී ඒ හිමියන්ට දොඩම් යුෂ වීදුරුවක් පිළිගන්වා උපවාසය අවසන් කළ අන්දම 1949 දිනමිණ පුවත්පතේ මුල් පිටුවේ පළවිය.

ඊට වසර කිහිපයකට පසු ඩඩ්ලි සේනානායක මහතා අගමැති පදවිය දරන යුගයේදීද පඤ්ඤාදස්සී හිමියන් මාතර කච්චේරිය අසල මාරාන්තික උපවාසයක් අරැඹූ බව අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායක මහතා මැදිහත් වී එම උපවාසයද අවසන් කළ බවත් වාර්තා විය.

1988-89 භීෂණ යුගයේදී මේ හිමි නමද අවාසනාවන්ත ලෙස ඝාතනයට ලක්විය. එම ඝාතනය සිදුකරන ලද්දේ රජයේ හමුදාව විසින්ද නැතිනම් ජවිපෙ සටන්කාමීන් විසින් ද යන්න තවම අභිරහසකි.

---

ජාත්‍යන්තර කීර්තියක් ලත් සිතාර් වාදන ශිල්පී ප්‍රදීප් රත්නායක පියවරුැන්ගේ දිනය යෙදෙන සැප්තැම්බර් මස පස්වනද බර්වුර්ඩ් කාලාගාරයේදී පැවැත්වීමට නියමිත ප්‍රදීපාංජලී ප්‍රසංගය, මෙල්බර්න් කලා ලෝලීන්ට අපූරු අත්දැකීමක් වනවා නොඅනුමානයි. ඉන්දියාවේ භාත්ඛන්ඩ විශ්ව විද්‍යාලයෙන් විශාරද



## ප්‍රදීපාංජිලි සමගින් ප්‍රදීප් රත්නායක

සම්මාන ලත් මේ නිපුන සංගීත ශිල්පියා ඇමෙරිකාවේ කොලොම්බියා සරසවියෙන් 'ත්‍ඹබඹර්සෘෂඨ්‍යඹ' ශිෂ්‍යත්වයක් ලබා සිය සංගීත ක්ෂේත්‍රය අපරදිග ලෝලීන් අතරටද ගෙන ගිය අයෙකි. ලාංකික ප්‍රවීණ වාදන ශිල්පීන් මෙන්ම ඉන්දීය හා අපරදිග සංගීත ශිල්පීන්ගේ සහභාගීත්වය ලබමින් ප්‍රදීප් රත්නායකයන් ඉදිරිපත් කරන මෙල්බර්න් ප්‍රසංගය නරඹන සැමගේම සිත් අභිනන්දනයට ලක්වෙනවා නියතය. ලොව පිලිගත් සිතාර් වාදකයා මෙතෙක් අප නුදුටු අයුරින් පෙර අපරදිග වාදක ශිල්පීන්ගේ තාල තරංග, සිතාරයෙන් නැගෙන සුමුදු හඩ සමග මුසු කරමින් ඉදිරිපත් කෙරෙන සංගීතයෙන් සැමට මහත් ආශ්වාදයක් ලබා දෙනු නියතය.

ඇමරිකාව, කැනඩාව, ජිනිවා, වියානා, බර්ලින්, අබුඩාබි, බැන්කොක් හා කොළඹ නගරයන්හි සංදර්ශන ගණනාවක්ම ඉදිරිපත් කර ඇති වාදක ප්‍රදීප් ඒ සෑම අවස්ථාවකදීම ඉතා උසස් ගනයේ පෙර අපරදිග සංගීතඥයන් හවුල් කරවා ගෙන ඇත. ඔහුගේ මෙල්බර්න් ප්‍රසංගයට එක්වන සංගීතඥයන්ද ඒ හා සමාන සුප්‍රසිද්ධ පිරිසක් වේ. ඕස්ට්‍රේලියාවේ ප්‍රමුඛ පියානෝ වාදක ජෝ කින්ඩටෝ තරුණ ඩ්‍රම් වාදක ශිල්පී ඩැනියෙල් ෆරුජයක් හා මෙල්බර්න් ප්‍රවීන වයලින් වාදක හෙලන් දයර්ස් ද ප්‍රදීප් රත්නායකයන්ට හවුල් වෙනවා ඇත.

ප්‍රදීප් රත්නායකයන්ගේ ජාත්‍යන්තර සංගීත සංදර්ශනයන්ට ලොව වටා කීර්තියක් ලත් වාදකයන් සහභාගී වි ඇත.

ප්‍රදිපාංජලි ප්‍රසංගය මෙල්බර්න් නගරයට ගෙන ඒම සඳහා දයකත්වය ලබා දෙන්නේ ශ්‍රී ලංකා ඕස්ට්‍රේලියා පරිත්‍යාග ශීලීන්ගේ සෞඛ්‍ය අරමුදල විසිනි. මෙම සේවාවාන්හි නිර්මාතෘ මෙල්බර්න් වෛද්‍ය රංජිත් හෙට්ටිආරච්චි මහත්මා ශ්‍රී ලංකා ජාතික රුධිර සේවාවේ අධ්‍යක්ෂක වෛද්‍ය දයානන්ද ගුණසේකර මහතාගේ සංවිධාකත්වය ලබා එකී වැඩසටහන් ලංකාව වටා දියත් කර ඇත. 2008 වසරේ ජනවාරි මාසයේදී ආරම්භ කරන ලද හෘද පණ ගැන්වීමේ ව්‍යාපෘතියේ වෛද්‍ය හෙට්ටිආරච්චි හා දයානන්ද ගුණසේකර මහතුන්, ඔවුන්ගේ කණ්ඩායම් සමග ලංකාව වටා මේ වනතෙක් 22000 කට අධික පිරිසකට මේ පුහුණුව ලබාදී අතර සෞඛ්‍ය අරමුදලේ ලේකම් නීතිඥ පුෂ්පා හෙට්ටිආරච්චි මහත්මියගේ මැදිහත් වීමෙන් හා සහභාගීත්වයෙ-න් ගිලන්රථ රැසක් ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙලේ රෝහල් කීපයකට පරිත්‍යාග කර ඇත. මේ සම්බන්ධව මෙල්බර්න්වාසීන් කිහිප දෙනෙක්ගේ නොමසුරු අනුග්‍රහය ලබන්නට හෙට්ටිආරච්චි මහත්මිය සමත් විය. හදයලි පණ ගැන්වීමේ හා ගිලන්රථ ව්‍යාපෘතිය සම්බන්ධව ලාංකීක ජනතාවගේ අවධානය යොමු කිරිමත්, අරමුදලට හැකි තරමින් ආධාර ලබාගැනිමත් ප්‍රදීපාංජලී සංදර්ශනය ඉදිරිපත් කරන සංවිධාකයන්ගේ අරමුණයි.

ප්‍රදීපාංජිලි සංදර්ශනය මෙල්බර්න් නගරයට ගෙන ඒමේ සංකල්පය ඉදිරිපත් කලේ සහකාර සංවිධායක උප උපදස මහත්මා විසිනි. උපා ප්‍රදීප් රත්නායකයන්ගේ දක්ෂතා හදුනා ගෙන මෙහි රසික රසියකයන් අතරට මෙය ගෙන එන්නට පුරෝගාමීව ක්‍රියාකර ඇත. ඔහු පසුගිය දශක කිපය තුල සියයකට අධික මෙල්බර්න් ප්‍රසංගයන්ට ආලෝක හා ශබ්ද පරිපාලනය සැපයීමෙන් ලත් අත්දැකිම් ප්‍රදීපාංජලිය රසවත් කිරිමෙහිලා උපයෝගී කරගන්නවා ඇත.

